# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ජනාධිපති මාධ්‍ය සම්මාන - 2018

## *අයදුම්පත් කැඳවීම*

විශිෂ්ට මාධ්‍ය සංස්කෘතියක් රට තුළ ස්ථාපිත කිරීම උදෙසා මාධ්‍යවේදීන් සිදු කරනු ලබන මෙහෙවර සහ ඔවුන්ගේ ගුණාත්මක දායකත්වය ඇගයීම සඳහා ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල වාර්ෂිකව පැවැත්වීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත.

ඒ සඳහා 2017 වසරේ මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් අඩවි මගින් පළ වූ/විකාශය වූ ස්වකීය කෘතීන් ඉදිරිපත් කරන ලෙස සියලු ම මාධ්‍යවේදීන්ට / මාධ්‍ය ආයතන ප්‍රධානීන්ට හා පුවත්පත් කතුවරුන්ට මෙමඟින් ඇරයුම් කෙරේ.

## සම්මාන පිරිනමන ක්ෂේත්‍ර

| **1.** | **පුවත්පත් ක්ෂේත්‍රය** | |
|---|---|---|
| **තරග අංශය** | PMA/NP/2017/001 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | PMA/NP/2017/002 | වසරේ ප්‍රශස්ත ඡායාරූපය |
| | PMA/NP/2017/003 | වසරේ ප්‍රශස්ත තීරු ලිපිය |
| | PMA/NP/2017/004 | වසරේ ප්‍රශස්ත කාටූන් නිර්මාණය |
| | PMA/NP/2017/005 | වසරේ ප්‍රශස්ත පිටු සැලසුම |
| | PMA/NP/2017/006 | වසරේ ප්‍රශස්ත විශේෂාංග ලිපිය |
| | PMA/NP/2017/007 | වසරේ ප්‍රශස්ත විමර්ශනාත්මක පුවත |

| **2.** | **රේඩියෝ ක්ෂේත්‍රය** | |
|---|---|---|
| **තරග අංශය** | PMA/RD/2017/001 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | PMA/RD/2017/002 | වසරේ ප්‍රශස්ත ගුවන් විදුලි වැඩසටහන |
| | PMA/RD/2017/003 | වසරේ ප්‍රශස්ත ළමා වැඩසටහන |
| | PMA/RD/2017/004 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන |
| | PMA/RD/2017/005 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන |

| **3.** | **ටෙලිවිෂන් ක්ෂේත්‍රය** | |
|---|---|---|
| **තරග අංශය** | PMA/TV/2017/001 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වාර්තාව |
| | PMA/TV/2017/002 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති නිවේදනය |
| | PMA/TV/2017/003 | වසරේ ප්‍රශස්ත වැඩසටහන් ඉදිරිපත් කිරීම |
| | PMA/TV/2017/004 | වසරේ ප්‍රශස්ත ගවේෂණාත්මක වැඩසටහන |
| | PMA/TV/2017/005 | වසරේ ප්‍රශස්ත වාර්තා වැඩසටහන |
| | PMA/TV/2017/006 | වසරේ ප්‍රශස්ත සංවාදාත්මක වැඩසටහන |
| | PMA/TV/2017/007 | වසරේ ප්‍රශස්ත අධ්‍යාපනික වැඩසටහන |

| **4.** | **වෙබ් අඩවි ක්ෂේත්‍රය** | |
|---|---|---|
| **තරග අංශය** | PMA/WB/2017/001 | වසරේ ප්‍රශස්ත ප්‍රවෘත්ති වෙබ් අඩවිය |
| | PMA/WB/2017/002 | වසරේ ප්‍රශස්ත වෙබ් වාර්තාකරණය |
| | PMA/WB/2017/003 | වසරේ ප්‍රශස්ත බහුමාධ්‍ය භාවිතය |
| | PMA/WB/2017/004 | වසරේ ප්‍රශස්ත බ්ලොග් (Blog) රචක |

(ජූරි මණ්ඩලයේ ඇගයීම මත සෑම ක්ෂේත්‍රයක් සඳහා ම යාව ජීව සම්මාන, නැගී එන යොවුන් මාධ්‍යවේදී සම්මාන සහ කුසලතා සහතික පිරිනමනු ලැබේ.)

**කෘතීන් ඉදිරිපත් කළයුතු ආකාරය**

ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල ජාතික මට්ටමේ ජනමාධ්‍ය කෘතීන් ඇගයීම උදෙසා පවත්වනු ලබන බැවින් ඒ සඳහා සුදුසුවන කෘතීන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම ඉදිරිපත් කළ හැකිය.

**කොන්දේසි**

01. මෙම සම්මාන උදෙසා 2017.01.01 දින සිට 2017.12.31 දක්වා පුවත්පත්, රේඩියෝ, ටෙලිවිෂන් හා වෙබ් අඩවි මඟින් පළමුවෙනි වරට පළ කරන ලද/ විකාශය කරන ලද කෘතීන් සලකා බලනු ලැබේ. නැවත විකාශය කරනු ලැබූ කෘතීන් තරගයට භාර ගනු නොලැබේ.

02. මෙම සම්මාන සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේ දේශීය මාධ්‍යයක පළ වූ/ විකාශය වූ කෘතීන් පමණි.

03. සම්මාන සඳහා ඉදිරිපත් කරන කෘතීන් ස්වතන්ත්‍ර විය යුතු අතර හැකිතාක් එම කෘතීන් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරන්නේ නම් මැනවි. එසේ නොවන අවස්ථාවල දී ස්වාධීනව වුව ද තමන්ගේ කෘතියක් බවට තමා විසින්ම සහතික කොට ඉදිරිපත් කළ හැකිය.

04. ඉදිරිපත් කරන කෘතියෙහි භාෂාව හා මාධ්‍ය ක්ෂේත්‍රය අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. එක් අයදුම්කරුවෙකුට සම්මාන ක්ෂේත්‍ර එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර එක් සම්මානයකට අදාළ ව ඉදිරිපත් කළ හැක්කේ උපරිම වශයෙන් කෘතීන් තුනකි. නමුත් එක් කෘතියකට එක් අයදුම්පතක් වශයෙන් වෙන වෙන ම එවිය යුතුය.

06. කෘතීන් ඉදිරිපත් කිරීමේදී අදාළ පුවත්පතෙහි/නාලිකාවෙහි/ වෙබ් අඩවියෙහි පළ වූ / විකාශය වූ කෘතීන් ආයතන ප්‍රධානීන්ට හෝ කර්තෘවරුන්ට කෘතියෙහි හිමිකරු වෙනුවෙන් ඉදිරිපත් කළ හැකිය.

07. (අ) පුවත්පත් මාධ්‍යයට අදාළ කෘතීන් ඉදිරිපත් කිරීමේදී නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග මුල් කෘතිය හෝ මුල් කෘතියේ සහතික කරන ලද පිටපතක් හෝ ඉදිරිපත් කළ යුතුය.

(ආ) ගුවන්විදුලි මාධ්‍යයට අදාළ කෘතීන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග DVD Playable මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) රූපවාහිනී මාධ්‍යයට අදාළ කෘතීන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග DVD Playable මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතුය. Data Format ලෙස ඉදිරිපත් කරන කෘතීන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) වෙබ් අඩවි මාධ්‍යයන්ට අදාළ කෘතීන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග සහතික කළ මුද්‍රිත පිටපතක ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති මාර්ග ගත අයදුම් පත්‍රයේ ( online application ) ඔබට අදාළ වන ස්ථානයේ Hyperlink සම්බන්ධතාව සඳහන් කිරීම අනිවාර්ය වේ.

08. ඔබ විසින් අයදුම් කරන සෑම තරග අංශයක් සඳහා ම අයදුම්පත්‍රය හා DVD/මුල් පිටපත් හෝ ඡායා පිටපත් ලියුම් කවරයක බහා ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ජනාධිපති මාධ්‍ය සම්මාන උළෙල - 2018 හා තරග අංකය සහ අංශය** (විස්තර පත්‍රිකාවේ සඳහන් පරිදි) සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලෙන් එවිය නොහැකි කෘතීන් ගෙනැවිත් බාරදිය හැකිය. ඉහත (07) (අ) (ආ) (ඇ) (ඈ) අයදුම්පත් බාරගනු ලබන්නේ සතියේ දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණක් වන අතර කෘතීන් බාරගැනීම 2018 අගෝස්තු 13 දින ප.ව. 4.00 ට අවසන් වේ.

09. අසම්පූර්ණ අයදුම්පත් සලකා බලනු නොලැබේ. විස්තර පත්‍රිකාව සහ අයදුම්පත්‍රය www.pma.gov.lk හෝ www.media.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. තරග අංශ සඳහා ඉදිරිපත් කරනු ලබන කෘතීන් විනිශ්චයෙන් පසු භාරදෙනු නොලැබේ.

**කෘතීන් එවිය යුතු ලිපිනය :**

අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්).
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක.163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

(වැඩිදුර විස්තර සඳහා 011-2513644 මඟින් අධ්‍යක්ෂ (සංවර්ධන) හෝ 011-2513451 මඟින් සහකාර ලේකම් (සංවර්ධන) හෝ 011 - 2513737 මඟින් සංවර්ධන අංශය අමතන්න)

**ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග**
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

MEDIA EXCELLENCE 2018

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# ජනාධිපති මාධ්‍ය සම්මාන - 2018
## අයදුම්පත්‍රය

❖ වෙබ් අඩවි ක්ෂේත්‍රය සඳහා අයදුම් කිරීමට www.pma.gov.lk හෝ www.media.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

| අයදුම්පත් අංකය | |
|---|---|

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ නම සහ විස්තරය

(අ) සම්පූර්ණ නම :...........................................................................................

.................................................................................................................................

(ආ) ක්ෂේත්‍රයේ භාවිත කරන නම :...........................................................................................

(ඇ) ජා.හැ.අංකය /විදේශ ගමන් බලපත්‍ර /රියදුරු බලපත්‍ර අංකය :..................................................

(ඈ) 2018.08.12 දිනට වයස :...........................................................................................

02. පුද්ගලික ලිපිනය :...........................................................................................

03. විද්‍යුත් තැපැල් ලිපිනය :...........................................................................................

04. දුරකථන අංකය නිවස :...........................................................................

ජංගම :...........................................................................

05. සේවා විස්තරය

(අ) සේවා ආයතනයේ නම :...........................................................................................

(ආ) සේවා ආයතනයේ ලිපිනය :...........................................................................................

(ඇ) දුරකථන අංකය :...........................................................................................

06. (අ) අයදුම් කරනු ලබන ක්ෂේත්‍රය : ☐ පුවත්පත් ☐ රේඩියෝ ☐ ටෙලිවිෂන් ☐ වෙබ් අඩවි

(ආ) අයදුම් කරනු ලබන භාෂාව : ☐ සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි

(කරුණාකර අදාළ ක්ෂේත්‍රය සහ භාෂාව සඳහා × ලකුණ යොදන්න)

(ඇ) අයදුම්කරනු ලබන තරග අංශය :........................................................................................

07. (අ) කෘතිය පළ වූ පුවත්පත :........................................................................................

(ආ) විකාශය වූ නාලිකාවේ නම :........................................................................................

(ඇ) කෘතිය පළ වූ වෙබ් අඩවිය :........................................................................................

08. කෘතිය පළ වූ / විකාශය වූ :

| දිනය | මාසය | වසර | වේලාව | කාලසීමාව |
|---|---|---|---|---|
| | | | | |

09. ඒක පුද්ගල කෘතියක් ද / සාමුහික :.......................................................................................

කෘතියක් ද යන වග (සාමුහික .......................................................................................

කෘතියක් නම් පමණක් අදාල පාර්ශව .......................................................................................

පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය) .......................................................................................

ජනාධිපති මාධ්‍ය සම්මාන 2018 සම්බන්ධ ප්‍රකාශිත කොන්දේසිවලට එකඟ වන අතර එහි විනිශ්චයන් සම්බන්ධයෙන් ජූරි සභාව විසින් ගන්නා තීරණය, අවසාන තීරණය වශයෙන් පිළිගනිමි/ගනිමු. මා/ අප විසින් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද විනිශ්චය සඳහා ඉදිරිපත් කරනු ලබන කෘතිය මාගේ/අපගේ/අප ආයතනයේ කෘතියක් බව ද එහි හිමිකම සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිවුවහොත්, එය නිරවුල්කර දීමේ වගකීම මා/ අප සතුවන බවත් මෙයින් සහතික කරමි/ කරමු.

| දිනය | අයදුම්කරු /කරුවන්ගේ නම් | අයදුම්කරු /කරුවන්ගේ අත්සන් |
|---|---|---|
| | | |

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

........................................................ මහතා / මහත්මිය (මාධ්‍යවේදියාගේ නම)මේ සමග ඉදිරිපත් කරන ........................................................................... (කෘතියේ නම)........................... (දිනය/වේලාව) (මෙය විද්‍යුත් මාධ්‍ය අයදුම්කරුවන් සඳහා පමණි.) පළ වු/ විකාශය වූ කෘතියක් බවත් එය ඔහුගේ/ ඇයගේ/ අප ආයතනයේ කෘතියක් බවත් මෙයින් සහතික කරමි.

දිනය :.................... ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව :.............................................